සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

11 ශ්‍රේණිය **කතෝලික ධර්මය I** කාලය පැය 1 යි

නම/ විභාග අංකයඃ

- සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01 ශුද්ධ බයිබලයේ ඉතිහාස පොත්වල පරමාර්ථය වන්නේ,

(i) දේව ප්‍රේමය වර්ධනය කිරීමයි. (ii) දේව විශ්වාසය වර්ධනය කිරීමයි.
(iii) ගැලවීමේ ඉතිහාසය වාර්තා කිරීමයි. (iv) ඒක දේව වන්දනාවට යොමු කිරීමයි.

02 ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ අපෝස්තුලුවරු සුබ අස්න දේශනා කිරීමට පටන් ගනු ලැබුවේ,

(i) බෙතානිය හා ජෙරුසලමෙන් ය. (ii) ඉදුමිය හා ජුදයාවෙන් ය.
(iii) ජෙරුසලමෙන් හා ජුදයාවෙන් ය. (iv) කයිසාරිය හා කපර්නාවුමෙන් ය.

03 ඩොමිෂියන් නම් රෝම අධිරාජ්‍යා යටතේ වූ දරුණු පීඩන සමයේ විශ්වාසකයින් ධෛර්යවත් කර විශ්වාසයේ ස්ථීරව පැවතීම සඳහා ලියූ ග්‍රන්ථයකි,

(i) එළිදරව් පොත (ii) ශු. මාක් සුබාරංචිය
(iii) දානියෙල් පොත (iv) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත

04 "ගණන් කළ නොහැකි අසංඛ්‍ය සමූහයක් වන ඔබ විසින් තෝරාගනු ලැබූ ඔබේ සෙනඟ මැද ඔබේ දාසයා සිටියි." මෙම ප්‍රකාශය කරන ලද්දේ,

(i) මෝසෙස් විසින් ය. (ii) සලමොන් රජු විසින් ය.
(iii) පාවුලු තුමා විසින් ය. (iv) ස්තේපන් විසින් ය.

05 පහත ප්‍රකාශ වලින් ප්‍රඥා සාහිත්‍යය සම්බන්ධ නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුලත් වරණය වන්නේ,

A - ධර්මිෂ්ඨ හා නිවැරදි ලෙස දිවි ගෙවීමට දේව ජනතාව උනන්දු කරයි.
B - ප්‍රඥාවන්තයින් පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.
C - ජීවිතයේ අරුත හා සීමාවන් අවබෝධ කර දෙයි.
D - ජනතාවගේ ගැටලු හා ඒවාට විසඳුම් දේව වේදීය කෝණයකින් ඉදිරිපත් කරයි.

(i) A හා B ය. (ii) A හා D ය. (iii) B හා D ය. (iv) A හා C ය.

06 ශුද්ධ වූ සභා නායකත්වයට පත් පේදුරු තුමාට විශේෂ බලයක් ලැබුණේ,

(i) පව් කමා කිරීමටත්, දේව ප්‍රේමය ගැන ඉගැන්වීමටත් ය.
(ii) සභාවට නිවැරදි මඟ පෙන්වීමටත්, නායකත්වය දැරීමටත් ය.
(iii) සභාවේ නායකත්වය දැරීමටත්, විශ්වාසය වර්ධනය කිරීමටත් ය.
(iv) පව් කමා කිරීමටත්, විශ්වාසය හා සදාචාරය පිළිබඳව ඉගැන්වීමටත් ය.

07 "ඔබ සභාවක් වශයෙන් එක්රැස් වන විට, සමිඳාණන් වහන්සේගේ රාත්‍රී භෝජනය වැළදීමක් සිදු නොවේ." මෙසේ සඳහන් වන්නේ,

(i) කොරෙන්ති ලිපියේ ය. (ii) අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතෙහි ය.
(iii) හෙබ්‍රෙව් ලිපියේ ය. (iv) කොලොස්සි ලිපියේ ය.

08 දිව්‍ය සත්ප්‍රසාද භෝජනයට සහභාගීවීමට නම් පළමුව කළ යුත්තේ,

(i) ආත්මිකව සූදානම් වීම ය. (ii) ශාරීරිකව සූදානම් වීම ය.

(iii) ප්‍රේමයේ පනත තුළ ජීවත් වීම ය. (iv) සේවය අතපසු කිරීම ය.

09 "මරියතුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව" යන සංවිධානයේ අරමුණ වන්නේ,

(i) දේව ගරුබිය වර්ධනය කිරීමයි.

(ii) යාච්ඤාව හා පශ්චත්තාපික ක්‍රියා මගින් ලෝකයේ පාපී බලවේග පරාජය කිරීමයි.

(iii) යක්ෂ බලවේග වලට එරෙහිව ශාරීරික හා ආත්මිකව සටනක් ගෙනයාමයි.

(iv) මරියතුමියගේ ශ්‍රී හෘදයට සැනසීම ගෙන දීමයි.

10 විශ්වාසය, බලාපොරොත්තුව හා ප්‍රේමය සම්පූර්ණත්වයට පත් වන්නේ,

(i) යාච්ඤාව තුළය. (ii) මර්දන ක්‍රියා තුළ ය.

(iii) පශ්චත්තාපය තුළ ය. (iv) පුණ්‍ය ක්‍රියා තුළ ය.

11 සිය දිවි නසා ගැනීම **අසල්වැසියන්ට** විරුද්ධව කරන පාපයක් වන්නේ,

(i) අසල්වැසියාට අපගේ උපකාර නොලැබෙන නිසා ය.

(ii) ජීවිතයේ අයිතිය දෙවියන්වහන්සේ සතු නිසා ය.

(iii) අසල්වැසියා සමඟ තිබූ සබඳතාවය හිතුවක්කාරී ලෙස අවසන් වන නිසා ය.

(iv) පස්වන දේව පනත කඩ වන නිසාය.

12 'නොදිරණ පසුම්බිද, නොපිරිහෙන ..................... ස්වර්ගයෙහි ඔබට සපයා ගන්න." මෙහි හිස්තැනට අදාළ වචනය වන්නේ,

(i) ධනයද (ii) බලයද (iii) අමරණීයත්වයද (iv) වස්තුවද

13 "කෙරාටික කම" යන වචනයට ඇති මුල් ග්‍රීක වචනයේ අර්ථය වන්නේ,

(i) වෙස් මූණක් දමා ගැනීමයි. (ii) රවටමින් වාසි සහගත ලෙස හැසිරීමයි.

(iii) වෙස් මූණක් දමා නාට්‍යයක රඟ පෑමයි. (iv) සැබෑ තත්ත්වය සඟවාගෙන රඟ පෑමේ යෙදීමයි.

14 ඉරුදින ජන වන්දනාවේදී සමරනු ලබන්නේ,

(i) පාස්කු අභිරහසයි. (ii) ක්‍රිස්තුන් වහන්සේගේ දුක් ප්‍රාප්තියයි.

(iii) ක්‍රිස්තුන් වහන්සේගේ මාංශගතවීමයි. (iv) ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයයි.

15 චතාරික සමය අවසාන වන්නේ,

(i) ආලේලුයියා සෙනසුරාදා ය. (ii) ගොබ් ඉරිදා ය.

(iii) මහ බ්‍රහස්පතින්දා ය. (iv) පාස්කු ඉරිදා ය.

16 දිව්‍ය පූජාවේ ආරම්භක පිළිවෙතෙහි ඇතුළත් කොටස් අඩංගු පිළිතුර වන්නේ,

A - හැඳින්වීම B - පශ්චත්තාපික පිළිවෙත C - ස්තෝත්‍ර යාගික යැදුම

D - පොදු යැදුම E - ධර්මානුශාසනාව

(i) AB හා E ය. (ii) BC හා D ය. (iii) CD හා E ය. (iv) AB හා D ය.

17 අන් අයගේ තනතුරු නැතිකර තමන් ඒ තැනට පත්වීම කිනම් දේව පනත්වලට විරුද්ධ ක්‍රියාවක්ද?

(i) 7 හා 10 (ii) 5 හා 10 (iii) 6 හා 9 (iv) 4 හා 5

18 දෙවියන් වහන්සේට පක්ෂපාතී වී ඔවුන් වහන්සේගේ වචනය අනුව ජීවත් විය යුතු බව පෙන්වා දෙන ශුද්ධ බයිබලයේ ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

(i) නික්මයාම ය. (ii) ද්විතීය නීති සංග්‍රහය ය.

(iii) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත ය. (iv) ලූක් සුබාරංචිය ය.

19 ග්‍රීක පිටපතෙහි (සෙප්ටුවාජින්ත) නෙහෙමියා සහ එස්තර් යන ග්‍රන්ථ දෙක අතරට ඇතුළත් කර ඇති ද්විතිය සම්මත ග්‍රන්ථ දෙක වන්නේ,

(i) තෝබිත් හා බාරුක් ය. (ii) උපදේශකයා හා බාරුක් ය.

(iii) ප්‍රඥාව හා සිරාක් ය. (iv) තෝබිත් හා ජුදිත් ය.

20 "මෙන්න මම මෙහිය. මා යැව්ව මැනව." යනුවෙන් සමිඳාණන් වහන්සේගේ හඬට පිළිතුරු දුන් දිවැසිවරයා,

(i) ජෙරමියා ය. (ii) එසකියෙල් ය. (iii) යෙසායා ය. (iv) ආමොස් ය.

21 විශ්වාසය ඇතිකරලීමේ අරමුණින් ලියන ලද සුබාරංචි ග්‍රන්ථයකි.

(i) ජොහාන් සුබාරංචිය (ii) ලූක් සුබාරංචිය

(iii) මාක් සුබාරංචිය (iv) මතෙව් සුබාරංචිය

22 යාච්ඤාවෙන් දෙවිඳුන් අත්දකින්නට අපට ඇරයුම් කරන ශුභාරංචි කතුවරයා වන්නේ,

(i) ශු. ලූක්තුමාය. (ii) ශු. මාක් තුමාය. (iii) ශු මතෙව් තුමාය. (iv) ශු ජොහාන් තුමාය.

23 සෙබදිගේ හා සලෝමිගේ පුත්‍රයන් වන්නේ,

(i) පේදුරු හා ඇන්ඩෘ ය. (ii) පිලිප් හා බර්තලමෙවුස් ය.

(iii) ජොහාන් හා මහා ජාකොබ්ය. (iv) පේදුරු හා ජොහාන් ය.

24 "ස්ත්‍රීය මවනුයේ පුරුෂයාගේ ඉල ඇටයකිනි." මෙසේ සඳහන් වන්නේ,

(i) මැවීම පිළිබඳ පළමු කතාවේ ය. (ii) මැවීම පිළිබඳ දෙවන කතාවේ ය.

(iii) නික්මයාම පොතේ දෙවන පරිච්ඡේදයේ ය. (iv) උත්පත්ති පොතෙහි පළමු පරිච්ඡේදයේ ය.

25 "උඟ නුඹ මැඩලීමට බලාගෙන සිටියි. එහෙත් නුඹට උඟ දමනය කළ හැකිය." මෙය අදාළ වන්නේ,

(i) ආදම් ඒවට ය. (ii) ආබෙල්ට ය. (iii) කායින්ට ය. (iv) සර්පයාට ය.

26 "ඔහු දෙවියන් වහන්සේ සමඟ සුහදතාවයෙන් හැසිරුණේ ය." මෙය ආදළ වන පුද්ගලයා වන්නේ,

(i) මෝසෙස් ය. (ii) ආබ්‍රහම් ය. (iii) ආරොන් ය. (iv) නෝවා ය.

27 "ජෝසෙප් ගැන කිසිවක් නොදත් රජතුමා" යන්නෙහි අර්ථය වන්නේ,

(i) නව රජතුමා ජෝසෙප්ගේ නම නොදැන සිටි බවයි.

(ii) නව රජතුමාට ජෝසෙප් ගැන දැන ගැනීමට අවශ්‍ය නොවූ බවයි.

(iii) නව රජතුමා ජෝසෙප් මිසරයට කළ මහඟු සේවාව පිළිබඳව කිසිවක් නොදත් බවයි.

(iv) නව රජතුමා ජෝසෙප්ගේ පෙළපතේ කෙනෙක් නොවූ බවයි.

28 පාරාවෝ මෝසෙස්ට සවන් නොදීමට හේතුව වූයේ,

(i) පාරාවෝ තම ඉන්ද්‍රජාලිකයන් බලවත් යයි සිතූ නිසා

(ii) මිසර දේශයේ දෙවියන් වහන්සේගේ හාස්කම් වැඩිවනු සඳහා

(iii) වහල් සේවකයින්ගේ අවශ්‍යතාවය පාරාවෝ හඳුනාගෙන සිටි නිසා

(iv) පාරාවෝ දෙවියන් වහන්සේගේ බලය දැන නොසිටි නිසා

29 "සඟ සෙත ලබන්නට ඔබ වෙහෙසිය යුතුය." මෙසේ සඳහන් වන්නේ,

(i) ගීතාවලියේ ය. (ii) හිතෝපදේශයේ ය.

(iii) එළිදරව් පොතෙහි ය. (iv) කිතුනු සුභාෂිතයේ ය.

30 'නුඹලාගේ පිරිමි දරුවන් චර්මච්ඡේදන කළ යුතුය'. මෙසේ සඳහන් වන්නේ දෙවියන් වහන්සේ කවුරුන් සමඟ ඇති කර ගත් ගිවිසුමේද?

(i) ආදි මව්පියන් සමඟ (ii) නෝවා සමඟ

(iii) ආබ්‍රහම් සමඟ (iv) ඉශ්‍රායෙල් ජනයා සමඟ

31 පාළුකරයට ගිය ජේසුස් වහන්සේගේ අරමුණ වූයේ,

(i) තම දූත සේවාව සඳහා ගැඹුරු සූදානමකට පිවිසීම යි.

(ii) සාතන් විසින් පරීක්‍ෂා කරනු ලැබීම යි.

(iii) තම ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කිරීමයි.

(iv) විශේෂ අත්දැකීමක් ලබා ගැනීමයි.

32 "දියණියනි, ධෛර්ය ගන්න. ඔබේ ඇදහිල්ල ඔබ සුවපත් කළේය." මීට සම්බන්ධ චරිතය වන්නේ,

(i) වෙරෝනිකා ය. (ii) මාර්තා ය.

(iii) සළුවට අත ගැසූ ස්ත්‍රීය ය. (iv) මග්දලාහි මරියා ය.

33 පහත සඳහන් උපමා අතරින් දේව රාජ්‍යයේ වටිනාකම් පිළිබඳව කියවෙන උපමා වන්නේ,

A - කිරිඳි පිළිබඳ උපමාව B - ඵලදාව නැති අත්තික්කා ගස පිළිබඳ උපමාව

C - අබ ඇටය සහ මුහුන් පිළිබඳ උපමාව D - වපුරන්නා පිළිබඳ උපමාව

(i) A, B, C (ii) A, C, D (iii) C, D, B (iv) A, B, D

34 "ක්‍රිස්තුන් වහන්සේ වැඩ සිටින්නේ කොතැනද එහි ................. ද දේව රාජ්‍යයද ඇත." මෙහි හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,

(i) ප්‍රේමය (ii) ප්‍රීතිය (iii) සාමය (iv) ජීවනය

35 ප්‍රසාද නිධානයක් දානය කිරීමේදී ආලේප කිරීමෙන් සංකේතවත් කරන්නේ,

(i) විශ්වාසය ඇති කිරීම ය. (ii) දේව ප්‍රේමය ඇති කිරීම ය.

(iii) ශක්තිමත් කිරීම ය. (iv) දේව දරුකම පෙන්වීම ය.

36 කිතුනුවකු මරණීය අවධානමක සිටින විටක දී අභිවෘද්ධි ආලේපය දානය කළ හැකි වන්නේ,

(i) රාජගුරු ප්‍රසාදීතුමාට පමණි. (ii) පූජා ප්‍රසාදීතුමෙකුට පමණි.

(iii) පැවිදි සොයුරියක් හා සහෝදර තුමනට ය. (iv) මීසම භාර පියතුමාට පමණි.

37 පහත සඳහන් ක්‍රියා අතරින් පශ්චත්තාපී ක්‍රියාවක් වන්නේ,

(i) කෙතරම් වෙහෙස වුවද අපට පැවරෙන කාර්ය සතුටින් ඉටු කිරීම ය.

(ii) වැඩිපුර ඇති දේ අන් අය හා බෙදා ගැනීම ය.

(iii) දිව්‍ය පූජාවට සහභාගී වී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම ය.

(iv) දුක් වේදනා හා බලාපොරොත්තු කඩවීම්වලදී ශෝක වීමය.

38 "රෝගීන්ගේ දිව්‍යමය ආලේපය" නැමැති අපෝස්තලික ව්‍යවස්ථාව ඉදිරිපත් කළ ශුද්ධෝත්තම පියතුමා වන්නේ,

(i) අති උතුම් 13 වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා ය.

(ii) අති උතුම් 2 වන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා ය.

(iii) අති උතුම් 16 වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා ය.

(iv) අති උතුම් 6 වන පාවුළු ශුද්ධෝත්තම පියතුමා ය.

39 වලංගු කතෝලික විවාහයක් අවලංගු කළ නොහැකි වන්නේ,

(i) විවාහය ජනතා සේවයේ ප්‍රසාද නිධානයක් වන නිසා ය.

(ii) එය දෙවියන් වහන්සේ ඉදිරියේ කළ ගිවිසුමක් වන නිසා ය.

(iii) විවාහය රජයේ ලියාපදිංචි කරන නිසා ය.

(iv) කතෝලික පූජකවරයා ඉදිරියේ විවාහය සිදුවන නිසා ය.

40 විවාහ නොවී තම මුළු ජීවිතයම දේව රාජ්‍යය උදෙසා කැප කිරීම,

(i) පූජක දිවිය යි. (ii) පූජක බඹසරයයි. (iii) පැවිදි දිවියයි. (iv) පතිවත රැකීමයි.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

11 ශ්‍රේණිය

# කතෝලික ධර්මය II

කාලය පැය 2 යි

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) කෙටි පිළිතුරු සපයන්න.

(i) බබිලෝනියානු විප්‍රවාසයෙන් පසු ජුදා ජාතියේ සමාජීය හා ආගමික ප්‍රතිස්ථාපනය පිළිබඳ කරුණු ඇතුළත් ශුද්ධ බයිබලයේ සඳහන් ග්‍රන්ථ 02 නම් කරන්න.

(ii) ශුද්ධවූ සභාව ශුද්ධාත්මයාණන් වහන්සේට හා ක්‍රිස්තුස් වහන්සේට සම්බන්ධ වන්නේ කෙසේද?

(iii) දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම් 2 ක් ලියන්න.

(iv) පුදසුන සූදානම් කිරීමේ පිළිවෙතට අයත් අනු කොටස් 02 ක් ලියන්න.

(v) ජේසුස් වහන්සේව අත් අඩංගුවට ගන්නට පැමිණි අවස්ථාවේ පරීක්ෂාවට වැටුණු අපෝස්තුළුවරු විසින් කළ දේවල් 02 ක් ලියන්න.

(vi) මල් උයනේ යාච්ඤාවෙන් පෙන්නුම් කරන කරුණු දෙකක් ලියන්න.

(vii) මිනිසාගේ උතුම්කම විද්‍යාමාන වන කරුණු 02 ක් ලියන්න.

(viii) මනස්ථාප ක්‍රම 02 ලියන්න.

(ix) කතෝලික විවාහයකට ඇති නීත්‍යානුකූල බාධා 02 ක් ලියන්න.

(x) මතෙව් සුබාරංචිය හා ලූක් සුබාරංචිය ලියවුණ ස්ථාන වෙන වෙනම ලියන්න.

(ලකුණු $2 \times 10 = 20$)

02 (i) ජුදයින් අතට පත් වීමෙන් පසු ජේසුස් වහන්සේව රැගෙන ගිය ස්ථාන 02 ක් ලියන්න.

(ii) කුරුසියේ එල්ලා සිටින ජේසුස් වහන්සේට ජුදයින් විසින් කළ අසාධාරණකම් 03 ක් ලියන්න.

(iii) 'ස්වර්ගීය ජීවිතය හිමිකර ගැනීම සඳහා පාසල් දරුවකු වශයෙන් ඔබට කළ හැකි යහපත් ක්‍රියා 05 ක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු $2+3+5=10$)

03 (i) දේව ප්‍රේමයට විරුද්ධ පව් 02 ක් ලියන්න.

(ii) දිව්‍ය පූජාව සිදු කිරීමේ ප්‍රධාන අරමුණු 03 ක් ලියන්න.

(iii) ඔබට ප්‍රේම කරන දෙවියන් වහන්සේට ප්‍රතිප්‍රේමය දැක්විය හැකි ආකාර 05 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු $2+3+5=10$)

04 (i) 'ලාඕස්' සහ 'එර්ගොන්' යන වචනවල අර්ථ ලියන්න.

(ii) ජනවන්දනාවේ ප්‍රධාන අංග 03 නම් කරන්න.

(iii) ජනවන්දනා මෙහෙයයන් අර්ථවත් කර ගැනීම සඳහා ඔබට, මීසම තුළ ක්‍රියාත්මක කළ හැකි කාර්යයන් 05 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු $2+3+5=10$)

05 (i) සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන දෙක සෙසු දේව ප්‍රසාද නිධානවලින් වෙනස් වීමට හේතු 02 ක් ලියන්න.

(ii) නිල පූජකවරයේ ධූර 03 නම් කරන්න.

(iii) පූජාප්‍රසාදීතුමන්ගේ වගකීම් 05 ක් විස්තර කරන්න. (ලකුණු $2+3+5=10$)

06 (i) දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමඟ ඇති කරගත් ගිවිසුමේ අඩංගු කරුණු 02 ක් ලියන්න.

(ii) ඉශ්‍රායෙල් ජනතාවගේ වර්ධනය මර්දනය කිරීමට මිසරයේ රජතුමා ගත් පියවර 03 ක් ලියන්න.

(iii) ඔබගේ ජීවිතය තුළ දිව්‍ය සංරක්ෂණය අත්දුටු අවස්ථාවක් විස්තර කරන්න. (ලකුණු $2+3+5=10$)

07 මාතෘකා දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) උත්තම පූජක යාච්ඤාව

(ii) මානව සම්පත සුරකිමු.

(iii) මිනිසා පාපයට වැටීම

(iv) පංච පුස්තකය (ලකුණු $2+3+5=10$)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 2 ) | 02. ( 3 ) | 03. ( 1 ) | 04. ( 2 ) | 05. ( 4 ) | 06. ( 4 ) | 07. ( 1 ) | 08. ( 3 ) | 09. ( 2 ) | 10. ( 1 ) |
| 11. ( 3 ) | 12. ( 4 ) | 13. ( 3 ) | 14. ( 1 ) | 15. ( 3 ) | 16. ( 4 ) | 17. ( 1 ) | 18. ( 2 ) | 19. ( 4 ) | 20. ( 3 ) |
| 21. ( 1 ) | 22. ( 1 ) | 23. ( 3 ) | 24. ( 2 ) | 25. ( 3 ) | 26. ( 4 ) | 27. ( 3 ) | 28. ( 2 ) | 29. ( 4 ) | 30. ( 3 ) |
| 31. ( 1 ) | 32. ( 3 ) | 33. ( 2 ) | 34. ( 4 ) | 35. ( 3 ) | 36. ( 2 ) | 37. ( 1 ) | 38. ( 4 ) | 39. ( 2 ) | 40. ( 2 ) |

(ල. 40)

## II පත්‍රය

(01) (i) එස්රා හා නෙහෙමියා 10/2

(ii) ක්‍රිස්තුන් වහන්සේ ස්ථාපිත කිරීම, ශුද්ධාත්මයාණෝ විසින් මෙහෙයවීම. 10/35

(iii) පූප කැඩීම, ස්වාමින් වහන්සේගේ රාත්‍රී භෝජනය, නව පාස්කු මංගල්‍යය, ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයේ සහභාගීකම.

(iv) පඬුරු පෙරහැර හා පඬුරු පිදීම, පඬුරු මත යැදුම 10/117

(v) ඔවුන් වහන්සේව අතහැර පලා යාම, උත්තම පූජකයාගේ දාසයා වූ මල්කුස්ගේ කණ කපාලීම, පේදුරුතුමා ඔවුන් වහන්සේව නොහඳුනන බවට තෙවරක් ප්‍රකාශ කිරීම 10/127

(vi) ජේසුස් වහන්සේගේ සැබෑ මනුෂ්‍යත්වය, දෙවියන් වහන්සේ හා ක්‍රිස්තුන් වහන්සේ අතර සබැඳියාව, ඔවුන් වහන්සේගේ දුක් ප්‍රාප්තිය

(vii) බුද්ධිය, නිදහස් කැමැත්ත, අමරණීය ආත්මය (11/19)

(viii) යාච්ඤාව, නිරාහාරශීල රැකීම, දන්දීම, දුක් වේදනා හා බලාපොරොත්තු කඩවීම් ඉවසීමෙන් විඳදරා ගැනීම, කොතරම් වෙහෙස වුවත් අපට පැවරෙන කාර්යය සතුටින් ඉටු කිරීම 11/67

(ix) වයස, නිදහස් කැමැත්ත, අපරාධ, ලේ නෑකම්, මිශ්‍ර විවාහ 10/78

(x) මතෙව් - සිරියා පලස්තීනයේ දී ලූක් - සිරියාවේ අන්තියෝකියේදී 11/13-14 (ලකුණු 2 x 10 = 20)

(02) (i) උත්තම පූජකයාගේ මැදුරට, ජුදා ශ්‍රේෂ්ඨාධිකරණයට, පිලාත් ආණ්ඩුකාරයාවෙත, හෙරෝද් වෙත 10/19,20

(ii) සරදම් කිරීම, කාස පිළිගැන්වීම, වස්ත්‍ර බෙදා ගැනීමට දාදු දැමීම, "ජේසු නසරේනු ජුදයින්ගේ රජ' යනුවෙන් දක්වමින් ලියූ පුවරුවක් කුරුසියට ඉහළින් තැබීම 10/20

(iii) ලියා ඇති පිළිතුරට අනුව ලකුණු දෙන්න.

(03) (i) දේව ආදරය පිළිබඳව මෙනෙහි නොකිරීම / දේව ප්‍රේමයට ප්‍රතිචාර නොදැක්වීම / දිව්‍යමය වූ යහපතින් කෙනෙක්ව වලක්වා ලීම.

(ii) දෙවියන් වහන්සේට නමස්කාර කිරීම / දෙවියන් වහන්සේට තුති පිදීම / පාපයට වන්දි ගෙවීම / ආත්මික හා ශාරීරික අවශ්‍යතා ඉල්ලා ගැනීම.

(iii) ලියා ඇති පිළිතුරට අනුව ලකුණු දෙන්න.

(04) (i) ලාඕස් - ජනතාව එර්ගොන් - වැටුපක් නොලබා කරන සේවය.

(ii) දිව්‍ය පූජාව / දේව ප්‍රසාද නිධාන / යාම යැදුම.

(iii) ලියා ඇති පිළිතුරට අනුව ලකුණු දෙන්න. (දිව්‍ය පූජාව සඳහා පෙර සූදානම, තේමාව, කියවීම, විශ්වාසකයින්ගේ යැදුම්, ගීතිකා වැනි දේවල් සඳහා සූදානම)

(05) (i) ධර්මදූත මෙහෙවරක් පැවරෙයි. / දේව ජනතාව ගොඩ නඟයි. / අන් අය ගැලවීම තුළින් තම ගැලවීම සලසා ගනියි.

(ii) රාජගුරු ප්‍රසාදි ධූරය / පූජා ප්‍රසාදි ධූරය / තේවාචාර ධූරය

(iii) සුබාරංචිය දේශනා කිරීම / සැබෑ එඬේරකු වීම / ජනවන්දනා මෙහෙයන් පැවැත්වීම. / තම පදවියේ රදගුරුතුමා සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම/ දේව ජනතාවගේ ආධ්‍යාත්මික අවශ්‍යතා සපුරා ලීම. (11 පෙළපොත 74, 75 පිටු උදව් කර ගන්න.)

(06) (i) අසංඛ්‍ය වූ දරු පරපුරක් ලබා දීම. / සඳහටම හිමි වන දේශයක් ලබාදීම.

(ii) බරවැඩ ගැනීම / උපදින විට පිරිමි දරුවන් මරා දැමීම / පිරිමි දරුවන් නයිල් ගඟට විසි කිරීම.

(iii) සිසුන්ගේ පිළිතුරට ලකුණු දෙන්න. (ළමයා ජීවිතයේ අත්දුටු අවස්ථාවක් ලියා තිබීම.)

(07) (i) 10 පෙළ පොත 120, 121 පිටු (ii) 10 පෙළ පොත 81, 82 පිටු

(iii) 11 පෙළ පොත 21, 22 පිටු (iv) 11 පෙළ පොත 01, 02 පිටු